# මැතිවරණ දෙපාර්තමේන්තුව
## தேர்தல்கள் திணைக்களம்


පොදු කාර්යාලය - 2868441-3
பொது அலுவலகம்

මැතිවරණ කොමසාරිස් - 2868444
தேர்தல்கள் ஆணையாளர் ෆැක්ස් பெக்ஸ் 2868445

සහකාර කොමසාරිස් (පාලන) 2868450
உதவி ஆணையாளர் (நிருவாகம்) ෆැක්ස් (பெக்ஸ்) 2868450

මැතිවරණ මහලේකම්කාර්යාලය,
තැ.පෙ. 2,
රාජගිරිය . 10107
தேர்தல்கள் செயலகம்,
த. பெ. 2,
இராஜகிரிய. 10107


මගේ අංකය : PE/10/24
இல :
ඔබේ අංකය :
உமது இல :
දිනය :
திகதி : 2010.02.17

TR/02/05

**සියළුම දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන් හා**

**නියෝජ්‍ය / ජ්‍යෙෂ්ඨ සහකාර / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,**

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2010</u>**

**<u>පොදු 231 ඉන්ධන ඇණවුම් මගින් ඉන්ධන ලබා ගැනීමේදී</u>**

**<u>අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග.</u>**

2010.04.08 දින පැවැත්වීමට නියමිත ඉහත සඳහන් ඡන්ද විමසීමේ මූලික සංවිධාන කටයුතුවලදී සහ ඡන්ද විමසීම් කාර්ය මණ්ඩල ප්‍රවාහනය හා අනෙකුත් රාජකාරී සඳහා යොදා ගනු ලබන රජයේ වාහන සඳහා ණය පහසුකම් යටතේ පොදු 231 ඇණවුම් මගින් ඉන්ධන ලබා ගැනීමේදී පහත සඳහන් උපදෙස් අනුගමනය කිරීමට කටයුතු කරන්න.

(I) අවශ්‍ය ඉන්ධන ඇණවුම් පොත් ගබඩාවෙන් ලබා ගැනීමේදී ඇණවුම්වල සඳහන් අංක පිළිවෙලට පොත් නිකුත් කිරීම හා භාරගැනීම.

(II) පොත් කිහිපයක් එකවර භාවිතා නොකිරීම හා එක් පොතක් අවසන් වූ පසු පමණක් ඊළඟ පොත භාවිතයට ගැනීම.

(III) ඉන්ධන ලබා ගැනීම සඳහා අමුණා ඇති ආකෘතිය පරිදි සකසා ගත් අයදුම්පතක් රියදුරන් ලවා සම්පූර්ණ කරවා ගැනීම.

(IV) ඉන්ධන නිකුත් කිරීම සඳහා ලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර, අවශ්‍ය විස්තර එහි ඇතුළත් කිරීම. එසේ ඇතුළත් කරන විස්තර වලට පහත දැක්වෙන තොරතුරුද අඩංගු විය යුතුය. ඉදිරි විගණන කටයුතු වලදී අවශ්‍ය වන , මෙම ලේඛනය ඡන්ද විමසීම නිමවී සති දෙකක් ඇතුළත සහකාර මැතිවරණ කොමසාරිස් භාරයට ගත යුතුය.

1. **වාහනයේ අංකය**
2. **වාහනය අයත් ආයතනයේ නම හා ලිපිනය**
3. **රියදුරු මහතාගේ නම**
4. **ඉන්ධන ඇණවුම් අංකය**
5. **ඉන්ධන වර්ගය (ඩීසල්ද / පෙට්‍රල්ද )**
6. **නිකුත් කරන ඉන්ධන ප්‍රමාණය**
7. **එන්ජින් ඔයිල්/ බ්‍රේක් ඔයිල්**
8. **ඉන්ධන ඇණවුම අත්සන් කරන මාණ්ඩලික නිලධාරියාගේ කෙටි අත්සන හා දිනය**
9. **ඉන්ධන ඇණවුම ලබාගත් රියදුරුගේ අත්සන**
10. **ඉන්ධන ඇණවුම සම්පූර්ණ කළ නිලධාරියාගේ කෙටි අත්සන**

02. **ඉන්ධන ඇණවුම් අත්සන් කිරීම නිලධාරීන් දෙදෙනෙකුට හෝ තිදෙනෙකුට සීමා කළ යුතුය. එසේ ඉන්ධන ඇණවුම් අත්සන් කිරීමට බලය දී ඇති නිලධාරීන්ගේ නම්, නිල නාම, රාජකාරී ලිපිනයන් සහ ආදර්ශ අත්සන් ඉන්ධන හල් හිමියන් වෙත කල් වේලා ඇතිව ලබාදිය යුතුය.**

03. **ණය පහසුකම් යටතේ ඉන්ධන ලබා ගැනීම සඳහා වාහනය රියදුරු සමඟ පමණක් නොයැවිය යුතු අතර, සෑම විටම කළමණාකරණ සහකාර නිලධාරියෙකු හෝ වෙනත් සුදුසු නිලධාරියෙකු සමඟ යැවිය යුතුය. අදාළ නිලධාරියා ඉදිරිපිටදී වාහනයේ ටැංකියට ඉන්ධන පිරවූ බවට ඇණවුමේ වම්පස ඉහළ කෙළවරේ සටහනක් යෙදිය යුතුය. මෙම සටහන පහත ආදර්ශ පරිදි රබර් මුද්‍රාවකින් තැබීමට කටයුතු කළ හැක.**

**මා ඉදිරියේදී ඉන්ධන ලීටර්** .......................... **ක් ටැංකියට පුරවන ලදී.**

**මයිලෝ මීටරයේ කියවීම.**

| | | |
|---|---|---|
| ..................... | ............................ | .......................... |
| **දිනය** | **වේලාව** | **අත්සන** |

04. **සංචිත වාහන වලට** (Pool Vehicles) **මෙන්ම නිලධාරීන් විසින් රැගෙන එන වෙන්කළ වාහන** (Assigned Vehicles) **සඳහාද ඉන්ධන ලබාදීමේදී මෙම විධිවිධානයන් අනුගමනය කළ යුතුය.**

**දයානන්ද දිශානායක,**
**මැතිවරණ කොමසාරිස්.**

**පිටපත් :** 1. **විගණකාධිපති**
2. **අතිරේක මැතිවරණ කොමසාරිස්** (1)
3. **ගණකාධිකාරී (මුදල්)**
4. **ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන)**

# මැතිවරණ දෙපාර්තමේන්තුව
## தேர்தல்கள் திணைக்களம்


පොදු කාර්යාලය - 2868441-3
பொது அலுவலகம்

මැතිවරණ කොමසාරිස් - 2868444
தேர்தல்கள் ஆணையாளர் ෆැක්ස් பெக்ஸ் 2868445

සහකාර කොමසාරිස් (පාලන) 2868450
உதவி ஆணையாளர் (நிருவாகம்) ෆැක්ස් (பெக்ஸ்) 2868450

මැතිවරණ මහලේකම්කාර්යාලය,
තැ.පෙ. 2,
රාජගිරිය . 10107
தேர்தல்கள் செயலகம்,
த. பெ. 2,
இராஜகிரிய. 10107


මගේ අංකය : P.E/10/24
இல :
ඔබේ අංකය :
உமது இல :
දිනය :
திகதி : 2010.02.19

**චක්‍රලේඛ අංක -TR/02 (06)**

**සියළුම තේරීම් භාර නිලධාරීන් හා**

**නියෝජ්‍ය / ජ්‍යෙෂ්ඨ සහකාර / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,**

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2010</u>**

**<u>තැපැල් හා පොලිස් දෙපාර්තමේන්තුවට වාහන ලබාදීම.</u>**

උකත් ඡන්ද විමසීමට අදාල නිල ඡන්ද දැන්වීම්පත් බෙදාහැරීම සඳහා තැපැල් දෙපාර්තමේන්තුව සතු වාහන ප්‍රමාණවත් නොවිය හැකි හෙයින් එම කාර්යය ඉටු කර ගැනීම සඳහා රජයේ වාහන කීපයක් ලබාදෙන ලෙස ඔවුන් ඔබෙන් ඉල්ලා සිටියහොත් ඒ සඳහා රජයේ වාහන කීපයක් සපයා දීම මැනවි. **එහෙත් එම වාහන වලට අවශ්‍ය ඉන්ධන රියදුරන්ගේ අතිකාල හා සංයුක්ත දීමනා ආදී සියළු වියදම් තැපැල් දෙපාර්තමේන්තුව විසින් දැරිය යුතුය.** ඡන්ද විමසීමට අදාලව තැපැල් දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන රාජකාරී සඳහා මවිසින් තැපැල් දෙපාර්තමේන්තුවට මුදල් ප්‍රතිපාදන ලබාදී ඇත.

02. සැම නිලධාරියෙකුම මෙම උපදෙස් වලට අනුකූලව කටයුතු කළ යුතු අතර ඊට පටහැනි වන ආකාරයෙන් කටයුතු කර ඉහත සඳහන් ඉන්ධන රියදුරු අතිකාල හා සංයුක්ත දීමනා ආදී ගෙවීම් මැතිවරණ වැය ශීර්ෂය යටතේ සිදුකර ඇති අවස්ථාවන් වාර්තා වුවහොත් ඊට අදාළ වගකිව යුතු නිලධාරීගෙන් ඒවා අයකර ගනු ලබන බවද කාරුණිකව දන්වමි.

03. ඉහත සඳහන් ඡන්ද විමසීමේ ආරක්ෂක රාජකාරී සඳහා පොලිස් දෙපාර්තමේන්තුවට ද වාහන විශාල සංඛ්‍යාවක් අවශ්‍ය වනු ඇත. තේරීම් භාර නිලධාරීන්ගේ අවශ්‍යතාවයට ප්‍රමාණවත් වාහන සංඛ්‍යාවක් තිබේ නම් පමණක් පොලිස් දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය සඳහා රජයේ වාහන ලබාදීම මැනවි. **මෙසේ ලබාදෙන වාහන සඳහා අවශ්‍ය ඉන්ධන සහ රියදුරන්ගේ අතිකාල හා ගමන් වියදම් ආදී සඳහා කරනු ලබන සියළු ගෙවීම් පොලිස් දෙපාර්තමේන්තුවට වෙන්කරදී ඇති ප්‍රතිපාදන වලින් දැරිය යුතුය.** පොලිස් දෙපාර්තමේන්තුවට වාහන ලබාදීමට තේරීම් භාර නිලධාරීන්ට හැකියාවක් නොමැති නම් ඒ බව ඔවුනට දැනුම් දිය යුතු අතර, පොලිස්පතිවරයාගේ අනුමැතිය යටතේ TR -02 (03) හා

2010.02.16 දිනැති චක්‍රලේඛයෙන් ලබාදී ඇති උපදෙස් පරිදි කුලී පදනම මත වාහන ලබා ගැනීමට ක්‍රියා කළ හැකිය. **එපරිදි ලබාගන්නා වාහන සඳහා කුලී ගෙවීම් සිදුකළ යුත්තේද පොලිස් දෙපාර්තමේන්තුවට වෙන්කරදී ඇති ප්‍රතිපාදන වලින් බවද ඔවුන් දැනුවත් කිරීමට කරුණාකර කටයුතු කරන්න.**

04. පොලිස් දෙපාර්තමේන්තුවට අවශ්‍ය කුලී වාහන ලබා දීමට තේරීම් භාර නිලධාරියා මැදිහත් වන්නේ නම් එසේ ලබාගන්නා වාහන සඳහා ගෙවීම් කරනුයේ පොලිස් දෙපාර්තමේන්තුව විසින් බවද ඒ සම්බන්ධ සියළු විමසීම් කළ යුත්තේ පොලිස්පතිවරයා හෝ ඔහුගේ නිලධාරීන්ගෙන් බවද අදාල කුලී වාහන හිමිකරුවන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

05. ශ්‍රී ලංකා යුධ හමුදාව කිසියම් කාර්යයකට කැඳවන්නේ නම් ඒ පොලිස් දෙපාර්තමේන්තුව විසින් ඔවුන්ගේ සහායට විය යුතුය. එහෙයින් හමුදා අවශ්‍යතා සඳහා වාහන සැපයීම සඳහා වන සියළුම ගෙවීම් පිළිබඳ වගකීම පොලිස් දෙපාර්තමේන්තුව විසින් දැරිය යුතුය.

**දයානන්ද දිශානායක,**
මැතිවරණ කොමසාරිස්.

**පිටපත්** : 01. තැපැල්පති, තැපැල් මූලස්ථානය. - සියළුම ප්‍රාදේශිය තැපැල් අධිකාරීවරුන් සහ අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට කාරුණිකව.

02. පොලිස්පති, පොලිස් මූලස්ථානය. - අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට කාරුණිකව

03. හමුදාපති, හමුදා මූලස්ථානය.

04. විගණකාධිපති

05. අතිරේක මැතිවරණ කොමසාරිස් (1)

06. ගණකාධිකාරී (මුදල්)

07. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන)

# මැතිවරණ දෙපාර්තමේන්තුව
## தேர்தல்கள் திணைக்களம்


පොදු කාර්යාලය - 2868441-3
பொது அலுவலகம் 

මැතිවරණ කොමසාරිස් - 2868444
தேர்தல்கள் ஆணையாளர் ෆැක්ස් பெக்ஸ் 2868445

සහකාර කොමසාරිස් (පාලන) 2868450
உதவி ஆணையாளர் (நிருவாகம்) ෆැක්ස් (பெக்ஸ்) 2868450

මැතිවරණ මහලේකම්කාර්යාලය,
තැ.පෙ. 2,
රාජගිරිය . 10107
தேர்தல்கள் செயலகம்,
த. பெ. 2,
இராஜகிரிய. 10107


මගේ අංකය : P.e/10/24
இல :
ඔබේ අංකය :
உமது இல :
දිනය :
திகதி : 2010.02.19

**චක්‍රලේඛ අංක -TR/02 (07)**

**සියළුම තේරීම් භාර නිලධාරීන් හා**

**නියෝජ්‍ය / ජ්‍යෙෂ්ඨ සහකාර / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,**

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2010</u>**

**<u>ඡන්ද විමසීම් රාජකාරී සඳහා යොදවා ගනු ලබන වාහන</u>**

**<u>හදිසි අනතුරු වලට භාජනය වීම.</u>**

උක්ත ඡන්ද විමසීමට අදාළ මූලික සංවිධාන කටයුතු ඇතුළුව ඡන්ද විමසීම් රාජකාරී සඳහා යොදවාගනු ලබන වාහනයක් හදිසි අනතුරකට භාජනය වුයේ නම්, සාමාන්‍ය මාර්ග අනතුරකදී අනුගමනය කළ යුතු සියළුම ක්‍රියාමාර්ග කිසිදු වෙනසකින් තොරව අනුගමනය කළ යුතුවේ. මෙම ක්‍රියා මාර්ගයන්ට පහත සඳහන් පියවරද ඇතුළත් විය යුතුය.

I. අනතුර පිළිබඳව නොපමාව පොලිසියට දැන්වීම.
II. වාහනය පූර්ණ රක්ෂණය කර ඇත්නම්, අදාළ රක්ෂණ ආයතනයට දැන්වීම.
III. අනතුර සිදුවන අවස්ථාවේ රථය පැදවූ රියදුරුගෙන් ප්‍රකාශයක් සටහන් කර ගැනීම.
IV. අනතුර සිදුවන අවස්ථාවේ රථයේ ගමන් කළ වෙනත් පුද්ගලයන් වී නම් ඔවුන්ගේ ප්‍රකාශ සටහන් කර ගැනීම.
V. රථයට සිදුවී ඇති හානි පිළිබඳව මාණ්ඩලික නිලධාරියෙකු ලවා පරීක්ෂා කර වාර්තාවක් ලබා ගැනීම.

02. අනතුරට පත් රථය අළුත්වැඩියා කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන අප දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂවලින් දරණු ලබන්නේ නම් ඉහත 1 ඡේදයේ සඳහන් වාර්තාවන්ට අමතරව පහත සඳහන් විස්තරද අප වෙත සැපයිය යුතුය.

I. රථයට සිදුවී ඇති හානි පිළිබඳ සම්පූර්ණ විස්තරයක්
II. දිස්ත්‍රික් මෝටර්රථ පරීක්ෂකගේ වාර්තාවක් සමඟ දළ ඇස්තමේන්තුවක්

03. මෙම දෙපාර්තමේන්තුව විසින් වාහනය අළුත්වැඩියා කටයුතු සිදුකරනු ලබන ආයතනයට කෙලින්ම මුදල් ගෙවීමක් සිදු නොකරන අතර, දරණ ලද වියදම් ප්‍රතිපූරණය කිරීමක් හෝ අවශ්‍ය මුදල් වාහනය අයත් දෙපාර්තමේන්තුවට ලබාදීම පමණක් කරනු ඇත.

**දයානන්ද දිසානායක,**

මැතිවරණ කොමසාරිස්.

**පිටපත්** : 01. ගණකාධිකාරී (මුදල්)
02. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන)

# මැතිවරණ දෙපාර්තමේන්තුව
## தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය - 2868441-3
**பொது அலுவலகம்**

මැතිවරණ කොමසාරිස් - 2868444
**தேர்தல்கள் ஆணையாளர்** ෆැක්ස් **தொலை நகல்** 2868445

සහකාර කොමසාරිස් (පාලන) 2868450
**உதவி ஆணையாளர் (நிருவாகம்)** ෆැක්ස් **(தொலை நகல்)** 2868450

මැතිවරණ මහලේකම් කාර්යාලය,
තැ.පෙ. 2,
රාජගිරිය . 10107
**தேர்தல்கள் செயலகம்,**
**த. பெ. 2,**
**இராஜகிரிய.** 10107

මගේ අංකය: P.E/10/24
**எனது இல:**
ඔබේ අංකය :
**உமது இல:**
දිනය : 2010.02.22

**චක්‍රලේඛ අංක -TR/02 (08)**

**සියළුම දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන් හා**

**නියෝජ්‍ය / ජ්‍යෙෂ්ඨ සහකාර / සහකාර මැතිවරණ කොමසාරිස් වරුන් වෙත,**

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2010.</u>**
**<u>ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන්, සහකාර තේරීම් භාර නිලධාරීන්</u>**
**<u>ඡන්ද විමසීමේ රාජකාරී සඳහා නිල වාහන (Assigned Vehicles) /</u>**
**<u>සංචිත වාහන (Pool Vehicles) රැගෙන යාම</u>**

උක්ත ඡන්ද විමසීමේදී ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී හෝ සහකාර තේරීම් භාර නිලධාරී වශයෙන් පත්වීම් ලබා ඇති නිලධාරීන් තමාට හිමි නිල වාහනයක් ඇත්තේ නම් එම නිල වාහනය තම කාර්යාලය / නිවසේ සිට අදාල දිස්ත්‍රික්කයට/ තේරීම්භාර නිලධාරී කාර්යාලයට යාම සඳහා පාවිච්චි කිරීම අනුමත කරමි. මේ අනුව තම නිල වාහනය රැගෙන යාමට බලාපොරොත්තු වන නිලධාරීන් ඒ බව කල් ඇතිව අදාල දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීට දැනුම් දී ඔහුගේ අනුමැතිය ලබාගත යුතුය.

02. මෙහිදී නිලධාරියා විසින් **තම නිල වාහනයට අදාල දිස්ත්‍රික්කයට/ තේරීම්භාර නිලධාරී කාර්යාලයට යාමට ප්‍රමාණවත් ඉන්ධන ප්‍රමාණය පමණක් තම කාර්යාලයෙන් ලබාගත යුතුය. එම ඉන්ධන සඳහා වැයවූ මුදල පමණක් මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ඔහුගේ කාර්යාලය වෙත ප්‍රතිපූරණය කරනු ලැබේ. නිල වාහනය යොදාගත් නිලධාරියාගේ නමට ඉන්ධන වියදම් ප්‍රතිපූරණය කිරීමක් කරනු නොලැබේ.** මේ සඳහා යොදාගත යුතු AV 1 ආකෘතිය මේ සමඟ අමුණා ඇත.

03. නිල වාහනයක් නොමැති එවැනි නිලධාරීන්ට මැතිවරණ දෙපාර්තමේන්තුවේ වාහන සංචිතයට විස්තර ලබාදුන් වාහන හැර වෙනත් වාහනයක් ඇත්තේ නම් එය රැගෙන යාමට

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අනුමැතිය ලබාගත හැකිය. එපරිදි වාහනයක් රැගෙන යාමට අදහස් කරන්නේ නම් ඒ බව කල් ඇතිව අදාල දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධාරීට / නියෝජ්‍ය / ජ්‍යෙෂ්ඨ සහකාර / සහකාර මැතිවරණ කොමසාරිස් වෙත දැනුම් දිය යුතුය.

04. **එම වාහනය සඳහා තම කාර්යාලයෙන් අදාල දිස්ත්‍රික්කයට/තෙරීම්භාර නිලධාරි කාර්යාලයට යාමට ප්‍රමාණවත් ඉන්ධන පමණක් ලබාගත යුතු අතර එම ඉන්ධන සඳහා වැයවූ මුදල් මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපූරණය කරනු ඇත. ඔහු ඡන්ද විමසීමට අදාළ රාජකාරීන්හි නිරත වන්නේ නම් ඒ සඳහාද ඡන්ද විමසීම නිමකර ආපසු තම කාර්යාලයට / නිවසට පැමිණීම සඳහාද අවශ්‍ය ඉන්ධන ද අදාල තේරීම් භාර නිලධාරි විසින් ලබාදෙනු ඇත.** සංචිත වාහන (Pool Vehicles) සඳහා නිකුත් කළ ඉන්ධන වියදම් ප්‍රතිපූරණය කිරීම සඳහා PV 1 ආකෘතිය යොදා ගත යුතුය. ඡන්ද විමසීම් රාජකාරීන්හි නිරත වූ නිලධාරීන්ට ගෙවන ලද දීමනා ප්‍රතිපූරණය කිරීමට ඉදිරිපත් කරන ආකෘති වල ඉන්ධන වියදම් ප්‍රතිපූරණය ඉල්ලීම් ඇතුලත් නොකළ යුතුය.

05. නිල වාහනය හෝ සංචිත වාහන රැගෙන යාමේදී රජයේ රියදුරෙකු යොදවා ගත යුතු අතර ඒ සඳහා වූ ගෙවීම් උපදෙස් මවිසින් නිකුත් කරනු ලබන ගෙවීම් චක්‍රලේඛය මගින් ලබාදෙනු ඇත.

**දයානන්ද දිසානායක,**
මැතිවරණ කොමසාරිස්.

**පිටපත්** :- 1. අතිරේක මැතිවරණ කොමසාරිස් (I) - දැනගැනීම සඳහා කාරුණිකව
2. නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (පාලන) - දැනගැනීම හා අවශ්‍ය උපදෙස් ලබාදීම සඳහා කාරුණිකව
3. විගණකාධිපති
4. ගණකාධිකාරී (මුදල්) - අංක 04 ජේදයේ සඳහන් පරිදි අවශ්‍ය කටයුතු කිරීම සඳහා
5. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන) - දැනගැනීම සඳහා

# මැතිවරණ දෙපාර්තමේන්තුව
## தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය - 2868441-3
பொது அலுவலகம்

මැතිවරණ කොමසාරිස් – 2868444
தேர்தல்கள் ஆணையாளர் ෆැක්ස් பெக்ஸ் 2868445

සහකාර කොමසාරිස් (පාලන) 2868450
உதவி ஆணையாளர் (நிருவாகம்) ෆැක්ස් (பெக்ஸ்) 2868450

මැතිවරණ මහලේකම් කාර්යාලය,
තැ.පෙ. 2,
රාජගිරිය . 10107
தேர்தல்கள் செயலகம்,
த. பெ. 2,
இராஜகிரிய. 10107


මගේ අංකය : පීර්/10/24
இல :
ඔබේ අංකය :
உமது இல :
දිනය : 2010.02.26
திகதි :

TR/02(09)

**සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා**

**නියෝජ්‍ය / ජ්‍යෙෂ්ඨ සහකාර / සහකාර**

**මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,**

**<u>2010 පාර්ලිමේන්තු මැතිවරණය</u>**

**<u>ඡන්ද පොළ ප්‍රවාහන කටයුතු සඳහා පෞද්ගලික බස්රථ යොදා ගැනිම.</u>**

2010.04.08 දින පැවැත්වෙන පාර්ලිමේන්තු මැතිවරණයේදී ඡන්ද පොළ කාර්ය මණ්ඩලය ලිපිද්‍රව්‍ය, ඡන්ද පෙට්ටි හා අනෙකුත් ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා බස්රථ, විශාල ප්‍රමාණයක් ඔබට අවශ්‍ය වනු ඇත.

02. පසුගිය ජනාධිපතිවරණ ඡන්ද විමසීමේදී ඡන්දපොළ කාර්ය මණ්ඩලය, ලිපිද්‍රව්‍ය හා ඡන්ද පෙට්ටි ප්‍රවාහනයට හා උතුරේ අවතැන් ඡන්ද දායකයින්ට පොකුරු ඡන්ද මධ්‍යස්ථාන කරා යාම සඳහාද ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ යොදාගනු ලැබුවද එහිදී මතුවූ ගැටළු තත්වයන් සැලකිල්ලට ගෙන 2010.04.08 දින පැවැත්වෙන පාර්ලිමේන්තු මැතිවරණයේදී ඡන්දපොළ ප්‍රවාහන කටයුතු සඳහා වැඩි ප්‍රමාණයක් පෞද්ගලික බස්රථ යොදා ගැනීමට මවිසින් බලාපොරොත්තු වනු ලැබේ.

03. මේ සඳහා යොදාගනු ලබන බස්රථ සඳහා මෙහි සඳහන් කර ඇති පරිදි ගෙවීම් කිරීමට පෞද්ගලික බස්රථ සංගම් සමඟ එකඟත්වයකට පැමිණ ඇති හෙයින් ඒ අනුව ගෙවීම් කිරීමට කරුණාකර කටයුතු කරන්න. යාපනය සහ වවුනියාව යන දිස්ත්‍රික්ක දෙකෙහි බස්රථ 2010.04.06 දින සවස 2.00 ට පෙර එම දිස්ත්‍රික්කයන්හි තේරීම් භාර නිලධාරීන් විසින් දැනුම් දෙන ලබන ස්ථාන වෙත වාර්තා කිරීමට හැකිවන පරිදි ගෙන්වා ගැනීමට කටයුතු කරන්න. **එදින වාර්තා කරන බස්රථ සඳහා පහත සඳහන් පරිදි එදිනට දින 1/2 ක් සඳහා ගෙවීම් කරන්න.**

| | | |
|---|---|---|
| ආසන 42 ට වැඩි බස්රථ සඳහා | - | රු. 2500/- |
| ආසන 25-29 දක්වා බස්රථ සඳහා | - | රු. 2000/- |
| ආසන 30-40 දක්වා බස්රථ සඳහා | - | රු. 2250/- |

2010.04.07 දින සිට පහත සඳහන් පරිදි ගෙවීම් කරන්න.

**ආසන 42 හෝ ඊට වැඩි බස්රථ දිස්ත්‍රික්කය තුළ ධාවනයේදී දිනකට**

| | |
|---|---|
| කි.මී. 50 දක්වා | රු. 5000/- |
| කි.මී. 50 සිට 75 දක්වා | රු. 6500/- |
| කි.මී. 75 සිට 100 දක්වා | රු. 7500/- |
| කි.මී. 100 සිට 125 දක්වා | රු. 8500/- |

**ආසන 25 සිට 29 දක්වා දිස්ත්‍රික්කය තුළ ධාවනයේදී දිනකට**

| | |
|---|---|
| කි.මී. 50 දක්වා | රු. 4000/- |
| කි.මී. 50 සිට 75 දක්වා | රු. 5500/- |
| කි.මී. 75 සිට 100 දක්වා | රු. 6500/- |
| කි.මී. 100 සිට 125 දක්වා | රු. 7500/- |

**ආසන 30 සිට 40 දක්වා දිස්ත්‍රික්කය තුළ ධාවනයේදී දිනකට**

| | |
|---|---|
| කි.මී. 50 දක්වා | රු. 4500/- |
| කි.මී. 50 සිට 75 දක්වා | රු. 6000/- |
| කි.මී. 75 සිට 100 දක්වා | රු. 7000/- |
| කි.මී. 100 සිට 125 දක්වා | රු. 8000/- |

04. මෙම බස්රථ සඳහා රියදුරු මහතා පමණක් සේවයේ නිරත කරවනු ලබන අතර ඉහත දීමනාවන්ට අමතරව ආහාර වෙනුවෙන් රියදුරුට දිනකට රු. 350/- ක මුදලක් ගෙවිය යුතුය.

05. උතුරු පළාතේ අවතැන් කඳවුරු වල වෙසෙන ඡන්ද දායකයින් පොකුරු ඡන්ද මධ්‍යස්ථාන වෙත ප්‍රවාහනය කිරීමට ද පෞද්ගලික බස්රථ යොදාගත යුතු අතර දිවයිනේ සෙසු සියළු දිස්ත්‍රික්කයන්හි ඡන්ද මධ්‍යස්ථාන වැඩි ප්‍රමාණයක් සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සලසා ගැනීම පිණිස පෞද්ගලික බස්රථ යොදා ගැනීමට කටයුතු කරන්න.

06. ඔබගේ දිස්ත්‍රික්කයේ ඡන්ද මධ්‍යස්ථාන සංඛ්‍යාවට සාපේක්ෂව අවශ්‍ය බස්රථ සංඛ්‍යාව ගණනය කර Fax අංක 2868450 මගින් නොපමාව මා වෙත දැනුම් දෙන්න. ඒ සමඟ කොතරම් බස්රථ සංඛ්‍යාවක් පෞද්ගලික බස් හිමියන්ගේ සංගමයට සැපයීමට හැකිවේද යන්න ලංකා පෞද්ගලික බස් හිමියන්ගේ සංගමයේ නියෝජිතයන් අමතා තොරතුරු ලබාගන්න. මේ සඳහා එම සංගමයේ දිස්ත්‍රික් නියෝජිතයන්ගේ නම් හා දුරකථන අංක ඇතුලත් ලේඛණයක් මීට අමුණා ඇත.

07. මෙම බස්රථ එක් එක් ඡන්ද මධ්‍යස්ථාන වෙත පිටත් කර හැරීමට ප්‍රථම ඡන්ද මධ්‍යස්ථානයට යා යුතු ගමන් මාර්ගය පිළිබඳව මාර්ග සටහනක් බස් රථයේ රියදුරු මහතා වෙත ලබාදීමට කරුණාකර කටයුතු කරන්න.

08. කොළඹ දිස්ත්‍රික්කයේ හා වෙනත් දිස්ත්‍රික්කයන්හි ඇතැම් ඡන්ද මධ්‍යස්ථානයන් වෙත ආසන 42 හෝ ඊට වැඩි ප්‍රමාණයේ ලොකු බස්රථ ධාවනය කිරීම අපහසු විය හැකිය. එබැවින් එබඳු ඡන්ද මධ්‍යස්ථාන කල් ඇතිව හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය කුඩා බස්රථ ලබා ගැනීමට කටයුතු කිරීම සුදුසු වේ. මේ පිළිබඳව ද අදාල බස් සංගම් නියෝජිත මහතුන් දැනුවත් කිරීමට කරුණාකර කටයුතු කරන්න.

09. මෙම ඡන්ද විමසීම සාර්ථක කර ගැනීම සඳහා ඔබගෙන් ලැබෙන සහාය බෙහෙවින් අගය කොට සලකමි.

**දයානන්ද දිශානායක,**
මැතිවරණ කොමසාරිස්.

**පිටපත් :** 01. විගණකාධිපති.
02. අතිරේක මැතිවරණ කොමසාරිස් (I)
03. නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (පාලන)
04. ගැමුණු විජේරත්න මහතා - ලංකා පෞද්ගලික බස්රථ හිමියන්ගේ සංගමය
05. ගණකාධිකාරී (මුදල්)
06. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන)

# මැතිවරණ දෙපාර්තමේන්තුව
## தேர்தல்கள் திணைக்களம்


පොදු කාර්යාලය - 2868441-3
பொது அலுவலகம்

මැතිවරණ කොමසාරිස් - 2868444
தேர்தல்கள் ஆணையாளர் ෆැක්ස් தொலை நகல் 2868445

සහකාර කොමසාරිස් (පාලන) 2868450
உதவி ஆணையாளர் (நிருவாகம்) ෆැක්ස් (தொலை நகல்) 2868450

මැතිවරණ මහලේකම් කාර්යාලය,
තැ.පෙ. 2,
රාජගිරිය . 10107
தேர்தல்கள் செயலகம்,
த. பெ. 2,
இராஜகிரிய. 10107


මගේ අංකය: පීඊ/10/24
எனது இல:
ඔබේ අංකය :
உமது இல:
දිනය : 2010.03.04

<u>TR 02 (10)</u>

**සියළුම දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන් හා**

**නියෝජ්‍ය / ජ්‍යෙෂ්ඨ සහකාර / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,**

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2010.04.08.</u>**

**<u>ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් / සහකාර තේරීම් භාර නිලධාරීන් සතු පෞද්ගලික වාහන මැතිවරණ රාජකාරී සඳහා යොදා ගැනීම.</u>**

ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් වශයෙන් හෝ සහකාර තේරීම් භාර නිලධාරීන් වශයෙන් හෝ කටයුතු කිරීම සඳහා තෝරා ගන්නා ලද නිලධාරීන්ට පෞද්ගලික වාහනයක් ඇත්තේ නම් එය ඡන්ද විමසීමේදී තම රාජකාරී සඳහා වාර්තා කිරීමට නියමිත දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත යාමට හා ඡන්ද විමසීමේ කටයුතු නිමවීමෙන් පසු ආපසු තම නිවස බලා ඒම සඳහා යොදා ගැනීම අනුමත කරමි.

02. එබැවින් ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී / සහකාර තේරීම් භාර නිලධාරී වශයෙන් පත් කිරීමට තෝරාගෙන ඇති නිලධාරීන් තම පෞද්ගලික වාහනය එම කාර්යය සඳහා යොදා ගැනීමට අනුමැතිය ඉල්ලුම් කරන්නේ නම් පහත සඳහන් කොන්දේසි යටතේ අනුමැතිය දීම හා **ආයතන සංග්‍රහයේ දැක්වෙන ගාස්තු ප්‍රමාණයන් යටතේ** එම රාජකාරීගමන් සඳහා සැතැපුම් කුලිය ගෙවීම අනුමත කරමි.

(I) මෙම වාහනය මනා ධාවන තත්වයකින් යුත් විශ්වාසවන්ත එකක් විය යුතුය.

(II) වාහනය පූර්ණ රක්ෂණ ආවරණය සහිත එකක් විය යුතුය. කිසියම් හදිසි අනතුරකින් හෝ වෙන යම් ආකාරයකින් වාහනයට හානියක් සිදුවුවහොත් එහි සියළු වගකීම රක්ෂණ ආයතනය හෝ තමන් විසින් විඳ දරගත යුතු අතර, ඒ සඳහා කිසිදු ආකාරයකින් දෙපාර්තමේන්තුව මැදිහත් වීමක් සිදු නොවනු ඇත.

(III) අදාළ වාහනයේ හිමිකාරීත්වය නිලධාරියාගේ හෝ කලත්‍රයාගේ විය යුතුය. (එය තහවුරු කිරීම සඳහා V-I ආකෘතිය පුරවා භාරදෙනු ලබන අවස්ථාවේදී රථයේ ආදායම් බලපත්‍රයේ ඡායා පිටපතක් ඊට අමුණා තිබිය යුතුය)

(IV) මෙම වාහන සඳහා නිලධාරියා සේවය කරන කාර්යාලයෙන් හෝ මැතිවරණ රාජකාරී පැවරී ඇති දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් / නියෝජ්‍ය / ජ්‍යෙෂ්ඨ සහකාර / සහකාර මැතිවරණ කොමසාරිස් හෝ කිසිදු අයුරකින් ඉන්ධන ලබාදීමක් සිදු නොකරනු ඇත. එබැවින් එවැනි ඉල්ලීම් කිසිදු අවස්ථාවකදී හෝ ඉදිරිපත් නොකළ යුතුය.

03. ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී / සහකාර තේරීම් භාර නිලධාරී වශයෙන් පත්කරනු ලැබූ නිලධාරියෙකු මෙම කොන්දේසි වලට යටත්ව තම පෞද්ගලික වාහනය/ ඡන්ද විමසීමේ කටයුතු සඳහා යොදා ගැනීමට **අදහස් කරන්නේ නම් ඒ සඳහා ඡන්ද විමසීමේ දිනයට පෙරාතුව ඒ බව අදාල දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධාරීට හෝ නියෝජ්‍ය / ජ්‍යෙෂ්ඨ සහකාර /සහකාර මැතිවරණ කොමසාරිස් වෙත ලිඛිතව දැනුම් දී පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.**

04. තම පෞද්ගලික වාහනය මැතිවරණ රාජකාරී සඳහා රැගෙන යන ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් / සහකාර තේරීම් භාර නිලධාරීන් විසින් අදාල තේරීම් භාර නිලධාරී වෙත වාර්තා කළ වහාම සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන) වෙත ලබාදී ඇති (V1) "ඡන්ද විමසීම් රාජකාරී සඳහා නිලධාරීන් රැගෙන එනු ලබන පෞද්ගලික වාහන පිළිබඳ තොරතුරු පත්‍රිකාව සම්පූර්ණ කර භාරදිය යුතුය. එහි ආදර්ශයක් මේ සමඟ අමුණා ඇත.

05. ඡන්ද විමසීම් කටයුතු අවසන් වී නිලධාරියා ආපසු පිටත්වීමට ප්‍රථම සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන) විසින් එම පත්‍රිකාවෙහි 'ආ' කොටස සම්පූර්ණ කර ඔහුට භාරදෙනු ඇත. නිලධාරියා ගමන් වියදම් ඉල්ලුම් කිරීමේදී එම සහතිකය වව්චරයට අමුණා ඉදිරිපත් කළ යුතුය. **මෙම සහතිකය නොමැති කිසිදු ගමන් වියදම් වව්චරයකට ගෙවීම් නොකිරීමට ගෙවීම් බලධාරීන් වග බලා ගත යුතුය.**

06. ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් හෝ ගණන් කිරීමේ සහකාර තේරීම් භාර නිලධාරීන් වශයෙන් පත්වීමක් ලබා ඇති නිලධාරියෙකුට පමණක් අවශ්‍ය නම් පෞද්ගලික රියදුරෙකු යොදා ගැනීමට අනුමැතිය ලබාගත හැකිය. තමන් වාහනය රැගෙන එන බවට දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරී / නියෝජ්‍ය / ජ්‍යෙෂ්ඨ සහකාර / සහකාර මැතිවරණ කොමසාරිස්ගෙන් අනුමැතිය ලබා ගන්නා අවස්ථාවේදීම රියදුරු මහතෙකු යොදවාගන්නා බව ද සඳහන් කර අනුමැතිය ලබාගත යුතුය. ඔහුට ගෙවනු ලබන දීමනාව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් තම පෞද්ගලික වාහනය සමඟ රියදුරෙකු රැගෙන ආ විට ගෙවනු ලබන ආකාරයටම වේ (TR-02 (11) බලන්න) **මෙම ගෙවීම් කරනු ලබන්නේ අදාල රියදුරාගේ නමට පමණි.** නිලධාරියා විසින් භාරදිය යුතු V1 ආකෘතියට අමතරව රියදුරු විසින් V-1 (A) ආකෘතිය සම්පූර්ණ කර සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන) වෙත ලබාදිය යුතුය. එහි "ආ" කොටස රියදුරුගේ පැමිණීමේ සහතිකය ලෙස ගමන් වියදම් වව්චරයට අමුණා ඉදිරිපත් කළ යුතුය. V-1 (A) ආකෘතියක්ද මේ සමඟ අමුණා ඇත.

**දයානන්ද දිසානායක,**
මැතිවරණ කොමසාරිස්.

**පිටපත් :**
1. අතිරේක මැතිවරණ කොමසාරිස් (I) - දැනගැනීම සඳහා.
2. නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (පාලන) - ඔබ විසින් යොදවනු ලබන නිලධාරීන් දැනුවත් කිරීම සඳහා
3. විගණකාධිපති.
4. ගණකාධිකාරී (මුදල්) - දැනගැනීමට හා අ.ක.ස.
5. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන) - දැනගැනීම සඳහා.

# මැතිවරණ දෙපාර්තමේන්තුව
## தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය - 2868441-3
பொது அலுவலகம்

මැතිවරණ කොමසාරිස් - 2868444
தேர்தல்கள் ஆணையாளர் ෆැක්ස් பெக்ஸ் 2868445

සහකාර කොමසාරිස් (පාලන) 2868450
உதவி ஆணையாளர் (நிருவாகம்) ෆැක්ස් (பெக்ஸ்) 2868450

මැතිවරණ මහලේකම් කාර්යාලය,
තැ.පෙ. 2,
රාජගිරිය. 10107
தேர்தல்கள் செயலகம்,
த. பெ. 2,
இராஜகிரிய. 10107

මගේ අංකය : PE/10/24
எனது இல:
ඔබේ අංකය :
உமது இல:
දිනය : 2010.03.04
திகதி :

<u>TR - 02 (11)</u>

**සියළුම දිස්ත්‍රික් තේරීම් භාර නිළධාරීන් හා**

**නියෝජ්‍ය / ජ්‍යෙෂ්ඨ සහකාර /සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,**

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2010.04.08</u>**

**<u>ඡන්ද පොළ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් පෞද්ගලික වාහන පාවිච්චි කිරීම</u>**

ඡන්ද පොළ රාජකාරී සඳහා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් වශයෙන් පත් කරනු ලබන **ඔබගේ දිස්ත්‍රික්කයේ සේවය කරන** නිළධාරීන්ට පෞද්ගලික වාහන ඇත්තේ නම් ඒවා පහත සඳහන් කොන්දේසිවලට යටත්ව කිලෝමීටර් එකකට රු.15/- හා සැතපුමකට රු.24/- බැගින් ගෙවීම මත ඡන්ද පොළ රාජකාරී සඳහා යොදා ගැනීම අනුමත කරමි.

**<u>02. කොන්දේසි :</u>**

I. **එම වාහනය කැරළි කෝලාහල හා මහජන කැළඹීම ආවරණය සහිත පූර්ණ රක්ෂණය කළ වාහනයක් වීම හා වාහනය ඉතා හොඳ ධාවන තත්වයෙන් තිබීම.**

II. **ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා වාහනය නොපැදවිය යුතුය.ඒ සඳහා රියැදුරකු යොදවාගත යුතුය.** රියදුරුට දිනකට රු.350/- බැගින් සංයුක්ත දීමනාවක් ගෙවනු ලැබේ. පැය 6 ට වැඩි එහෙත් පැය 12කට අඩු කාල පරිච්ඡේදයක් සඳහා සංයුක්ත දීමනාවෙන් අඩක් ගෙවිය හැක.2010.04.07 දින රාත්‍රිය සඳහා ඔහුට 25% දීමනාව ලබාගත හැක.

III. **එම වාහනය ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා, කාර්යාල කාර්ය සහායක, පොලිස් නිළධාරීන් දෙදෙනෙකු හා රියැදුරු ඇතුළු පස් දෙනෙකුට පහසුවෙන් ගමන් කළ හැකි විය යුතු අතර,එම අයගේ ගමන් මලුත්, ඡන්ද පෙට්ටි ඇතුළු අනෙකුත් අරක්ෂක ද්‍රව්‍ය රැගෙන යාමට පහසුකම් තිබිය යුතුය. මේ සඳහා මරුටි, මාරුටි, ස්ටාර්ලට් වැනි කුඩා කාර් (Beetle Car) භාවිතා නොකළ යුතුය.**

IV. මෙම වාහන සඳහා නිළධාරියා සේවය කරන කාර්යාලයෙන් හෝ මැතිවරණ රාජකාරී පැවරී ඇති දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් / නියෝජ්‍ය / ජ්‍යෙෂ්ඨ සහකාර / සහකාර මැතිවරණ කොමසාරිස් හෝ කිසිදු අයුරකින් ඉන්ධන ලබාදීමක් සිදු නොකරනු ඇත. එබැවින් එවැනි ඉල්ලීම් කිසිදු අවස්ථාවකදී හෝ ඉදිරිපත් නොකළ යුතුය.

V. පෞද්ගලික වාහන යොදා ගැනීමට බලාපොරොත්තු වන ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ඒ සඳහා දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරී / නියෝජ්‍ය / ජ්‍යෙෂ්ඨ සහකාර / සහකාර මැතිවරණ කොමසාරිස්ගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

VI. ඉහත පරිදි කිලෝමීටර් ගාස්තු ගෙවිය හැකි වන්නේ අදාළ වාහනය සිය කාර්ය මණ්ඩලය හා ඡන්ද පෙට්ටි රැගෙන ඡන්ද පොළට යාමට සහ ඡන්ද විමසීමෙන් පසු එම ඡන්ද පෙට්ටි රැගෙන ඒමට යොදා ගනු ලැබී නම් පමණි.

VII. ඡන්ද පොළ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් විසින් රැගෙන එන පෞද්ගලික වාහන සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම සඳහා වු ආදර්ශ ආකෘතියක් මේ සමඟ අමුණා ඇත. එය පිටපත් දෙකකින් සම්පූර්ණ කරවාගෙන ඉන් එක් පිටපතක් නිළධාරියාට භාරදීමට කටයුතු කළ යුතුය.

VIII. තම සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කය තුල ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකු වශයෙන් පත්වීමක් ලැබු නිලධාරියෙකුගේ නිවස එම දිස්ත්‍රික්කය තුල පිහිටා ඇත්තේ නම් හා ඔහු එහි පදිංචිව සිට සේවයට පැමිණෙන්නේ නම් (නිළධාරියා පදිංචි ස්ථානය ඔහුගේ සේවා ස්ථානයේ ප්‍රධානියාගේ සහතික කිරීමට යටත්ව) නිළධාරියා ගමන පිටත් වු ස්ථානය නිවස සේ සළකා ඔහුට නියමිත ඡන්ද මධ්‍යස්ථානය දක්වා හා ආපසු තම නිවස දක්වා ගමන් කිරීමට සැතපුම් ගාස්තු ගෙවීමට ඉඩදිය හැකිය.

IX. මෙලෙස වාහන රැගෙන එන ජ්‍යෙෂ්ඨ ස්ථානාධිපතිවරුන්ට කරනු ලබන ගෙවීම් මැතිවරණ කාර්යාලවලින් පමණක් කළ යුතු අතර, වෙනත් කාර්යාල මඟින් ගෙවීම් කර ප්‍රතිපූර්ණ කරවා ගැනීමට උපදෙස් නොදිය යුතුය.වෙනත් කාර්යාලවලින් ගෙවා ප්‍රතිපූර්ණයට කරන ඉල්ලීම ප්‍රතික්ෂේප කරන බවද කරුණාවෙන් සලකන්න.

03. ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් / සහකාර තේරීම් භාර නිළධාරීන් රැගෙන යන පෞද්ගලික වාහන සඳහා මෙම ගෙවීම් අදාළ නොවන බව සැලකිය යුතු අතර ඔවුන් රැගෙන ගිය රියදුරන් සඳහා ගෙවීම් මෙහි සඳහන් ආකාරයටම වේ.

**දයානන්ද දිශානායක,**
මැතිවරණ කොමසාරිස්.

**පිටපත් -**1. අතිරේක මැතිවරණ කොමසාරිස් (1)
2. නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (පාලන)
3. විගණකාධිපති
4. ගණකාධිකාරී (මුදල්)
5. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන)